ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
ව්‍යවසායකත්ව හා කුඩා ව්‍යාපාර කළමනාකරණ වැඩ සටහන
අවසාන පරීක්ෂණය - 2008 / 2009
මූලික සංඛ්‍යානය හා ආර්ථික විද්‍යාව – MCC 1103
කාලය පැය දෙකයි (02)

---

දිනය : 2008.12.14 වේලාව : පෙ. ව .10.00 සිට මධ්‍යාහ්න 12.00 දක්වා

---

පොදු උපදෙස් :

1. A කොටසෙන් ප්‍රශ්න 2 කටත් B කොටසින් ප්‍රශ්න 2 කටත් පිළිතුරු සපයන්න.
2. එක් කොටසකින් පැය බැගින් කාලය වෙන් කරන්නේ නම් මැනවි.
3. එක් එක් කොටසට වෙන් වෙන්ව පිළිතුරු සපයා වෙන් වෙන්ව අමුණා බාර දෙන්න.
4. ප්‍රස්ථාර කොළ සපයනු ලැබේ.
5. වැඩ සටහන් ගත කළ නොහැකි ගණක යන්ත්‍ර භාවිතා කළ හැකිය.
6. සියළුම ප්‍රශ්නවලට සමාන ලකුණු ලැබේ.

## A කොටස - ආර්ථික විද්‍යාව

01. i. රටක් මුහුණ දෙන මූලික ආර්ථික විද්‍යා ප්‍රශ්න මොනවාද?

ii. මිශ්‍ර ආර්ථිකයක් ඇති රටක් මෙම ප්‍රශ්න විසඳන ආකාරය පැහැදිලි කරන්න.

iii. ආර්ථික වර්ධනය යනු කුමක්ද? නිෂ්පාදන හැකියා වක්‍රය උපයෝගී කර ගෙන පැහැදිලි කරන්න.

02. i. සැපයුම් න්‍යාය යනු කුමක්ද?

ii. "සැපයුමේ වෙනස්වීම සහ සැපයුම් ප්‍රමාණයේ වෙනස්වීම, එකම දෙය අදහස් නොකරයි" ඔබ එකඟ වන්නේද? රූප සටහන් ආධාරයෙන් විස්තර කරන්න.

iii. ඉල්ලුම් සැපයුම් විශ්ලේෂණය ආධාරයෙන් පහත දී ඇති තත්වයන්හිදී, වෙළඳ පල තත්වය වෙනස්වන ආකාරය විස්තර කරන්න.

(අ) X භාණ්ඩය නිපදවනු ලබන්නේ වැඩි වශයෙන් කම්කරුවන් භාවිතයෙනි. කම්කරු වැටුප් වැඩි වූ විට X භාණ්ඩය සඳහා වෙළඳ පල කුමක්ද?

(ආ) පරිගණක මිල පහත දැමුණු විට, මෘදුකාංග සඳහා වෙළඳ පල කුමක්ද?

(ඇ) වී ගොවීන් සඳහා රජය සහනාධාරයක් දුන් විට, වී සඳහා වෙළඳ පල කුමක්ද?

(ඈ) පාන් මිල පහත වැටුන විට, වී සඳහා වෙළඳ පල කුමක්ද?

(ඉ) පුද්ගලයන්ගේ ආදායම වැඩි වූ විට කළු සුදු රූපවාහිනී සඳහා වෙළඳ පල කුමක්ද?

03. පහත සඳහන් දෑ ගැන කෙටි සටහන් ලියන්න.

i. භාණ්ඩ හුවමාරු ක්‍රමය සහ එහි ඇති අවාසි

ii. ආදායම් සහ ආදේශණ ප්‍රතිවිපාක

iii. පූර්ණ තරගකාරී වෙළඳපළ

iv. හිගතාවය සහ ආවස්ථික පිරිවැය

04. පහත සඳහන් ව්‍යාපාර ක්‍රියාත්මක වන්නේ කුමන වෙළඳ පල තුළද?

i. රක්‍ෂණ සේවාව සපයන ව්‍යාපාරයක්

ii. පාවහන් නිෂ්පාදනය කරන ව්‍යාපාරයක්

ඔබගේ පිළිතුරට හේතු දක්වන්න.

මෙම ආයතන මිල තීරකයන්ද, නැත්නම් මිල ලබාගන්නන්ද? පිළිතුරට හේතු දක්වන්න.

**B – කොටස - සංඛ්‍යානය**

05. i. $243 \times (27)^{-4/3}$ සුලු කරන්න.

ii (අ) 5.7 හි අගය (5+0.7) ලෙස ගෙන $(5.7)^2$ හි අගය සොයන්න.

(ආ) අගය සොයන්න $\dfrac{|\underline{12}}{|\underline{8}}$

iii පහත සමීකරණ විසඳන්න.

(අ) $7x - 5[x - \{7 - 6(x - 3)\}] = 2x + 5$

(ආ) $3x + 5y = 19$
$X + 3y = 9$

(ඇ) $15x^2 - 10x = 40$

(ඈ) පැයට කි. මී. 4 ක වේගයෙන් මිනිසකු A සිට B දක්වා ගමන් කරයි. ඔහු පැයට කි. මී. $3\ ^2/_3$ ක වේගයෙන් ගමන් කලේ නම් එම දුරයාමට වැඩිපුර පැය 3ක් ගතවේ. A සිට B අතර දුර සොයන්න.

06. i. පහත සඳහන් දෑ කෙටියෙන් පැහැදිලි කරන්න.

(අ) ස්තෘත නියැදිය

(ආ) පොකුරු නියැදිය

(ඇ) බහු පියවර නියැදිය

OPEN UNIVERSITY OF SRI LANKA
LIBRARY

ii. පහත සඳහන් ඒවායින් නොගැලපෙන්නේ කුමන මිනුමද? පැහැදිලි කරන්න.

iii පරීක්ෂණයකදී ශිෂ්‍යයන් කණ්ඩායම් දෙකක් ලබාගත් ලකුණු පහත සඳහන් වගුවලින් පෙන්වා ඇත.

(අ)

| | | | | | |
|---|---|---|---|---|---|
| ලකුණු | 0 | 1 | 2 | 3 | y |
| සංඛ්‍යාතය | 10 | 5 | 8 | x | 3 |

මෙම ලකුණුවල මධ්‍යස්ථය 1.5 නම් x හි අගය සොයන්න.

(ආ)

| | | | | | |
|---|---|---|---|---|---|
| ලකුණු | 0 | 1 | 2 | 3 | x |
| සංඛ්‍යාතය | 10 | 5 | 8 | y | 3 |

මෙම ලකුණුවල මධ්‍යන්‍යය 1.5 නම් y හි අගය සොයන්න.

07. i. දත්ත ඉදිරිපත් කල හැකි පහත ක්‍රම පැහැදිලි කරන්න.

(අ) රූපමය ප්‍රස්ථාර

(ආ) වට ප්‍රස්ථාර

(ඇ) ස්ථම්භ ප්‍රස්ථාර

ii සුපිරි වෙළඳසැලකින් පාරිභෝගිකයන් 30 දෙනෙකු විසින් මිලදී ගන්නා ලද භාණ්ඩ සංඛ්‍යාවන් පහත දක්වා ඇත.

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 15 | 8 | 6 | 9 | 9 | 4 | 18 | 10 | 10 | 12 |
| 12 | 7 | 7 | 8 | 12 | 10 | 10 | 11 | 9 | 13 |
| 5 | 6 | 11 | 14 | 5 | 6 | 6 | 5 | 13 | 5 |

(අ) සංඛ්‍යාත ව්‍යාප්තියක් ගොඩනගන්න.

(ආ) මධ්‍යන්‍යය සහ මධ්‍යස්ථය සොයන්න.

(ඇ) සම්මත අපගමනය සොයන්න.

(ඇ) ඉහත ප්‍රතිඵල විග්‍රහ කරන්න.

- හිමිකම් ඇවිරිණි -